# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## වතු වෛද්‍ය වෘත්තික, ශාන්ත කූම්බ්ස් වත්ත, තලවකැලේ

ඉහත තනතුර දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය**

වතු අධිකාරිවරයාගේ මගපෙන්වීම යටතේ සේවක සේවිකාවන්ගේ එදිනෙද වෛද්‍ය අවශ්‍යතා සඳහා යෙදෙමින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම. තවද, අදාළ සියලුම ලිපිලේඛන පවත්වාගෙන යමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සමග සෞඛ්‍ය සේවා සම්බන්ධීකරණය කළ යුතුය.

**අධ්‍යාපනික සුදුසුකම්**

අ.පො.ස (සා/පෙළ) විභාගය ඉංග්‍රීසි හා අංක ගණිතය / ගණිතය සමග (වෘත්තියෙහි පළපුරුද්ද සහිත අයට මෙය අදාළ නොවේ).

– සහ –

ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලියාපදිංචි සාමාජිකයකු වීම.

**පළපුරුද්ද**

කනිෂ්ඨ වතු වෛද්‍ය සහකාරවරයකු (JEMA) ලෙස වසර 4 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය**

රු. 32,350-1,575x40-95,320/- මාසිකව

**වාර්ෂික වර්ධකය :** රු. 1,575/-

**වයස් සීමාව**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අයදුම්කරු තලවකැලේ ශාන්ත කූම්බ්ස් වත්තේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මගින් පාලනය වන වෙනත් ඕනෑම වත්තක, සේවා අවශ්‍යතා පරිදි සේවය කළ යුතුය.

සියලුම ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, උප්පැන්න සහතික පිටපත, අදාළ අධ්‍යාපනික හා වෙනත් වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සහ අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ නිපුණතා හා දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග පහත අත්සන් කරන අය වෙත 2022 මාර්තු 21 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට පටහැනිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

වැඩිමනත් තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය www.tri.lk වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**